www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දීය අයවැය: ව්‍යාපාර සඳහා සහන, කම්කරුවන්ට නව බර පැටවීම්

## India's budget: Concessions to business, new burdens for workers

දීපාල් ජයසේකර විසිනි
2010 මාර්තු 5

පෙබරවාරි 26 දා මුදල් ඇමති ප්‍රනාබ් මුඛර්ජි විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල ඉන්දීය ජාතික අයවැයෙන්, දේශීය හා විදේශීය මහා ව්‍යාපාර විසින් ඉල්ලන ලද බදු සහන ගොන්නක් සහ "ප්‍රතිසංස්කරන" වැඩසටහන් ගැන උදම් ඇනුවේය. පෙට්‍රල් අනුබද්ධිත නිෂ්පාදන හා පොහොර මිලගනන් දරුනු අන්දමට ඉහල දමමින් සහ සමාජ වියදම් නියම ලෙසම කපාහරිමින්, ඉන්දීය කම්කරුවන් සහ ග්‍රාමීය දුගීන් මත නව බරපැටවීම් සිදුකර ඇත.

ආයතනික නැවතගෙවීමේ බදු සියයට 10 සිට 7.5 දක්වා අඩුකිරීම, සමහර ප්‍රධාන අංශවල විදේශීය සෘජු ආයෝජන සීමා ඉහලදැමීම, මූල්‍ය අංශ ප්‍රතිව්‍යුහගතකරන කොමිසම පිහිටවීම, සහ රාජ්‍ය ආයතන පෞද්ගලිකරනය හෙවත් "අනායෝජන" ඉහලනැංවීම, මෙම ව්‍යාපාර හා ආයෝජක "යෝග්‍ය" වැඩසටහනට ඇතුලත් විය.

මහා අවපාතයෙන් මෙපිට ලෝක ධනවාදයේ දැවැන්තම අර්බුදය තුල පවා නව ලිබරල් "ප්‍රතිසංස්කරනවලට" ආන්ඩුවේ බැඳීම පෙන්නුම්කරන සහ රාජ්‍ය වාර්ෂික අයවැය හිඟය සීඝ්‍රව අවමකල අයවැය, මහා ව්‍යාපාර විසින් සාදරයෙන් පිලිගන්නා ලදී. මුඛර්ජි සිය අයවැය කතාව නිමකරන්නට පෙරාතුවම, රටෙහි පිලිගත් කොටස් දර්ශකය වන සෙන්සෙක්ස් නමැති බොම්බායේ කොටස් හුවමාරු දර්ශකය 350 කින් හදිසියේම ඉහල නැංගේය.

"හොඳ සමබර වැඩක්" කිරීම වෙනුවෙන් ඉන්දීය වෙලඳ සහ කර්මාන්ත මන්ඩල ෆෙඩරේෂනයේ සභාපති හර්ෂ්පති සින්ගානියා මුඛර්ජිට ප්‍රශංසා කල අතර, "වර්ධනය ඉදිරියට යෑම" සාක්ෂාත් කරන "බොහෝ සමබර සහ වගකීම් සහගත අයවැයක්" බවට ඉන්දීය කර්මාන්ත කොන්ෆෙඩරේෂනයේ (ඉකකො) සභාපති වේනු සිරිනිවාසන් අයවැය නිර්වචනය කලේය.

අයවැය සම්බන්ධව මහා ව්‍යාපාරවල එකම පැමිනිල්ල වූයේ සියයට 15 සිට සියයට 18 දක්වා අවම විකල්ප බද්ද (අවිබ) වැඩි කිරීමයි. "අවිබ වැඩිකිරීම එකම කලු පැල්ලමයි" ඉකකො සභාපති පැවසීය.

2008 අගභාගයේදී සහ 2009 මුලදී, කොන්ග්‍රස් පක්ෂය මෙහෙයවන එක්සත් ප්‍රගතිශීලී සන්ධාන ආන්ඩුව (එප්‍රස) ඉදිරිපත් කල ආර්ථික "සහන" පැකේජ යටතේ, මහා ව්‍යාපාර සහ විශේෂිතවම අපනයනකරුවන් සඳහා පිරිනැමූ දැවැන්ත තාවකාලික බදු සහන, ක්‍රමානුකූල අයුරින් පමනක් ඉවත්කරන්නට රජය තීරනය කිරීම ඉන්දීය කර්මාන්තකරුවන්ගේ සුවිශේෂී සංතෝෂයට හේතු විය.

ඉදිරි වසරවලදී, ඉන්දියාවේ අයවැය හිඟයට දළදේනි අනුපාතය ප්‍රබලව අවම කිරීමේ අවශ්‍යතාවය ගැන, ඉන්දියානු සහ අන්තර්ජාතික මූල්‍ය කවයන් තුල බහුලව සාකච්ඡා පැවතුනි. නමුත් එක්සත් ප්‍රගතිශීලී සන්ධාන රජය, ඉන්දීය මහා ව්‍යාපාරවල ඒකමතිකභාවය පෙන්නුම් කරමින්, එහි ප්‍රථම ඉලක්කය "ඉහල" ආර්ථික වර්ධනයකට ඉන්දියාව ආපසු පැමිනීම බව ප්‍රකාශ කලේය. එම අන්තයට යෑමට, සහන පැකේජ හදිසියෙන්ම ඉවත් කරනවා වෙනුවට කොටස් වශයෙන් හකුලා දැමීමට රජය තීරනය කලේය.

එබැවින් රජය ඛනිජ තෙල් නොවන නිෂ්පාදන මත නිෂ්පාදන බද්ද සියයට 2 කින් එනම් සියයට 10 දක්වා ඉහල දැම්මේය. 2008 දෙසැම්බරයට පෙරාතුව නිෂ්පාදන බද්ද සියයට 14 ක් විය. 2008 දෙසැම්බරයේ සහන පැකේජයට පෙර සියයට 12ක් වුන සේවා බද්ද වෙනසක් නොමැතිව සියයට 10 ම පවතිනු ඇත.

ඉන්දියාව ගෝලීය ආර්ථික අර්බුදයට හොඳින් මුහුන දී ඇති බවත් වසර දෙකක් තුල සියයට 9 ට වැඩි වර්ධනයකට ආපසු යා යුතු බවත් මුඛර්ජි සහ එක්සත් ප්‍රගතිශීලී සන්ධානය ප්‍රකාශ කරති.

ඉන්දියාව මන්දාවධමනයට ඇද වැටුනේ නැති බව පිලිගැනිනි. නමුත් එහි ප්‍රසාරනයවීමේ අනුපාතය සීඝ්‍රව පහලට වැටුන අතර අපේක්ෂිත මට්ටමට වඩා පහල ගියේය. සීඝ්‍රව ප්‍රසාරනය වන තරුන ජනගහනය ශ්‍රම බලකායට උකහා ගැනීමත් ධනේශ්වර ආර්ථික "ප්‍රතිසංස්කරන" වැඩසටහන සඳහා සහයෝගය දීමත් අවශ්‍ය බව අගමැති මන්මෝහන් සිං පැවසීය.

සහන වැඩපිලිවෙල ක්‍රමානුකූලව හැකිලීමේ රජයේ තීන්දුව වත්මන් "ප්‍රකෘතිභාවයට" පත්වීමේ බිඳෙන සුලු බව පිලිගැනීමක් බවට සැලකිය හැක.

රටෙහි ආනයන සියයට 30 කින් පහල ගියේ වුවත්, ලෝක මන්දාවධමනය තුල ඉන්දීය ආර්ථිකය ප්‍රසාරනය වීම දිගටම සිදුවෙද්දී, ඉන්දියානු කම්කරුවන් හා ගම්බද දුගීන්ට උද්ධමනය ඉහල යෑමෙන්, විශේෂිතවම ආහාර මිලෙහි උද්ධමනයෙන්, බරපතලව පහර වැදී තිබේ.

දශකයේ වැඩිම අගය සනිටුහන් කරමින්, සිල්ලර මිල ගනන් සියයට 8.5 ක අනුපාතයකින් වර්තමානයේ ඉහල යමින් පවතින අතර සිල්ලර ආහාර මිල ගනන් සියයට 20 කට ආසන්න අනුපාතයකින් වැඩි වෙමින් පවතී.

සිල්ලර ආහාර මිල ගනන් වඩා වේගයෙන් ඉහල නගිමින් පවතින්නේ දැනටමත් මිලියන සියයක ජනතාවක් අන්ත දුගීභාවයේ ගිලී සිටින රටක් තුලය.

මහා ව්‍යාපාරවල අවශ්‍යතා කෙරෙහි හැරෙන අතරේ, රජය විසින් ප්‍රකාශයට පත්කරන බදු ඉහල දැමීම් සහ සහනාධාර කපාහැරීම්, උද්ධමන ගින්නට තවදුරටත් පිදුරු දැමීමක් වනු ඇත.

අයවැය මගින් පැට්‍රල් සහ ඩීසල් මත රේගු බද්ද සියයට 2.5 සිට සියයට 7.5 දක්වා ඉහල දැමූ අතර (ඉන්දියාව තම පැට්‍රෝලියම් පරිභෝජනයෙන් සියයට 70 ක් ආනයනය කරයි) එම දෙවර්ගයටම ලීටරයකට රුපියල බැගින් නිෂ්පාදන බද්ද ඉහල දැමුනි. මෙම වැඩපිලිවෙලවල් තුලින් තෙල් මිල ගනන් වැඩිවීමකට මග පාදන අතර, එය ආර්ථිකය පුරාවට ප්‍රවාහන වියදම් සහ අවසානයේ සියලු භාන්ඩ මිල වැඩිවීමක් ලෙස එකිනෙකට සම්බන්ධ වනු ඇත.

රජය විසින් පත්කල කිරිත් පරීඛ් කමිටුව පැට්‍රල් සහ ඩීසල් මිල පාලනයෙන් ඉවත් කිරීමටත් ගෘහස්ථ ගෑස් සහ භූමිතෙල් මත රජයේ සහනාධාර තියුනු ලෙස අඩුකිරීමටත් මෑතක දී යෝජනා කලේය. මෙම යෝජනාවලට පුලුල්ව පැතිරුන විරෝධතාවක් පැනනැගුන නමුත්, රජය "මූල්‍යමය ඒකාබද්ධවීමක්", එනම් අයවැය හිගය අඩුකිරීමට ක්‍රියාමාර්ග ගැනීම, සමග ඉදිරියට යන අන්දමට අඩුම තරමින් ඉන් සමහරක් ක්‍රියාත්මක කරනු ඇති බවට මුඛර්ජි ඉගි කලේය. "මෙම යෝජනා ගැන තීරනය, යථා කාලයේදී මගේ මිත්‍ර පැට්‍රෝලියම් සහ ස්වාභාවික ගෑස් ඇමති විසින් ගනු ඇත." මුදල් ඇමති පැවසීය.

ගොවියන්හට මරු පහරක් එල්ල කරමින් රජය පොහොර සහනාධාරය සැලකිය යුතු ලෙස අඩු කර තිබේ.

එහි ප්‍රතිපලයක් ලෙස වඩා බහුලව පාවිච්චිකරන පොහොර වන යූරියා මිල සියයට 10 කින් වැඩිවේ.

මහජන කැලඹීමක් ඇතිවේය යන බියෙන් පාලක සභාගයේ වඩා වැදගත් පක්ෂ දෙකක් වන බටහිර බෙංගාලයේ ත්‍රිනමුල් කොංග්‍රසයත් තමිල්නාඩුවේ ඩීඑම්කේ පක්ෂයත් තෙල් මිල ඉහල නැංවීම හෙලා දැක තිබේ. නමුත් අගමැති මන්මෝහන් සිං සහ කොංග්‍රස් පක්ෂ සභාපති සෝනියා ගාන්ධි විසින් එම විවේචන බිඳහෙලනු ලැබ ඇත. "කිසියම් මිල වැඩිකිරීමකින් සමහර මිනිසුන්ට පීඩා ගෙනදෙනවා." සවුදි අරාබියේ සංචාරයක් නිමකර ආපසු ඉන්දියාවට පැමිනෙමින් සිටි සිං වාර්තාකරුවන්ට පැවසීය. "නමුත් අපි දිගුකාලීනව සිතිය යුතුයි."

රජය "මූල්‍යමය ඒකාබද්ධවීම" කරගෙනයාමට අදහස් කරන්නේ කවරෙකුගේ වියදමින්ද යන වග තෙල් සහ පොහොර මිල ඉහලනැංවීමෙන් පැහැදිලිව පෙන්නා දෙයි.

මහා ව්‍යාපාර වෙතින් පැසසුම් ලැබීමට, රජය ලබන මාසයේදී අවසන් වන වර්තමාන මූල්‍ය වසරේ සියයට 6.9 වන අයවැය හිඟයට දදේනි අනුපාතය සියයට 5.5කට, සියයට 4.8, සහ සියයට 4.1 පිලිවෙලින් 2010 11, 2011 12, සහ 2012 13 වසරවලදී අඩුකරන බවට මුඛර්ජි පොරොන්දු වූයේය. බැංකුකරුවෙක් සහ මූල්‍ය අංශයේ විශේෂඥයෙක් වන උදායි කොටාක් ප්‍රකාශ කලේ: "මූල්‍ය හිගය පාලනය කිරීමේ පැත්තෙන් අයවැය බොහෝ ධනාත්මකයි."

කොන්ග්‍රස් පක්ෂය ප්‍රමුඛ එක්සත් ප්‍රගතිශීලී සන්ධාන රජය තම මුල් පාලන කාලය තුලදී, සීඝ්‍ර ආර්ථික වර්ධනය මගින් නිර්මානය වුන වැඩිවූ බදු ආදායමේ කොටසක් පාවිච්චි කරමින් සමාජ වියදම් ඉහල දමන අතරතුරේදී, නව ලිබරල් ප්‍රතිපත්ති සමග පෙරට ගියේය. මෙයට සෑම ග්‍රාමීය පවුලක එක සාමාජිකයෙකුට අඩුම තරමින් වසරකට දින 100 ක සොච්චම් අවම වැටුපක් සැපයෙන රැකියා සුරක්ෂිත ක්‍රමයක් ස්ථාපිත කිරීම ද ඇතුලත් විය.

ඉන්දීය ධනේශ්වරයේ ප්‍රධානතම පක්ෂය වන කොන්ග්‍රසයේ සම්ප්‍රදායක් හැටියට තම අයවැය *ආම් අද්මි* (පොදු මිනිසා) ට කැපවූවක් බවට මුඛර්ජි තොරොම්බල් කලේය. යථාර්තය නම් එය සමාජ වියදම් කපා හරින බවයි.

"අන්තර්ගත වැඩසටහන සහ සමාජ වැඩපිලිවෙල සම්බන්ධයෙන් අයවැය තරමක් සම්ප්‍රදායක වේ." *ටයිම්ස් ඔෆ් ඉන්ඩියාහි* අයවැයට ඉතා පක්ෂපාතී විචාරකයෙක් සඳහන් කලේය. "... එබැවින් දැන් මහත්මා ගාන්ධි ජාතික ග්‍රාමීය රැකියා සුරක්ෂිතතා වැඩසටහන යනුවෙන් නැවත නම් කල පලමු පෙලේ අන්තර්ගත වැඩසටහන වන එන්ආර්ඊජීඒ සඳහා, මුලු වියදම ගිය වසරේ රුපියල් කෝටි 39,100 සමග සන්සන්දනය කරද්දී, ස්ථිරසාරව රු. කෝටි 40,100 කට නාමිකව පැලපදියම්වී ඇත. එය මූර්ත වශයෙන් පහල බැසීමකි. ග්‍රාමීය සංවර්ධනය, හෝ කෘෂිකර්මාන්තය, හෝ පාසල් අධ්‍යාපනය හා සාක්ෂරතාවය, හෝ කාන්තා හා ලමා සංවර්ධනය, හෝ සෞඛ්‍යය සඳහා සමස්ථ වියදම් වැඩසටහන සලකා බැලුවහොත් ඇත්තේ ඒ හා සමානම කතාන්දරයකි. මෙම සියලු සමාජ අන්තර්ගත වැඩසටහන්හි වියදම් ප්‍රමානයන් පසුගිය වසර සමග සසඳන විට අඩුවැඩි වශයෙන් සමාන මට්ටම්වල රැඳෙන අතර, එහි තේරුම වන්නේ නියම තත්වයට අනුව පහල බැසීමකි."

ආන්ඩුව අයවැය හිඟය සහ බලාපොරොත්තු වූ මූල්‍ය ආධාර නොලැබීම දෙසට ඇඟිල්ල දිගු කරමින් සමාජ වියදම් කපාහැරීම සාධාරනීකරනය කරන අතරතුරේදී, මේ වසර තුල පමනක් ඉන්දීය ව්‍යාපාරවලින් ඩොලර් බිලියන දස ගනනක ආදායමක් ලැබීමට බලාපොරොත්තු වන බව "නොවැලැක්විය හැකි (බදු) ආදායම" ගැන තමන්ගේම ඉලක්කම් පෙන්නා දෙයි.

මුඛර්ජි තම අයවැය ගොවියන් සඳහා බවට ද චිත්‍රනය කලේය. ඇත්තටම වාරිමාර්ග සහ අනෙකුත් ආකාරයේ කෘෂිකර්මාන්තය සඳහා වූ අවශ්‍යතාවයන් වෙනුවෙන් රාජ්‍ය ආයෝජනවලට වඩා, ආනයන මූලික මහා ව්‍යාපාර විසින් අපේක්ෂා කරන යටිතල පහසුකම් නිෂ්පාදනවලට ප්‍රමුඛතාවය දීමේ දැනට දශක දෙකකට වඩා පැරනි ක්‍රමපිලිවෙල, අයවැය මගින් තවදුරටත් ඉදිරියට ගෙනයාමට සැලසුම් කර ඇත. *හින්දු* පුවත්පතට ලිපියක් ලියන පී. සයිනාත් සඳහන් කරන අන්දමට, රාජ්‍ය නය පහසුකම් වැඩිකිරීම සුලු ගොවියාගේ සිට කෘෂි ව්‍යාපාර වෙත යොමු කර තිබේ. නවතම අයවැයෙන්, විදේශ පාදක කෘෂි ව්‍යාපාර සඳහා ශීත ගබඩා ඉදිකිරීමට කෘෂිකාර්මික නය පහසුකම් ඇති කරමින් එම ක්‍රමය දිගටම ක්‍රියාත්මක වේ.

ගිය සතියේ අයවැයෙන්, හමුදා ආරක්ෂක වියදම් සඳහා පෙනෙන ආකාරයට සියයට 4 ක ප්‍රමානවත් වැඩිකිරීමක් ප්‍රකාශ කර තිබේ. කෙසේවුවද, මෙම වෙන් කිරීම, ගිය වසරේ අවසන් අයවැයෙන් හමුදා වියදම් සඳහා වෙන්කල සියයට 34 ක දැවැන්ත වැඩිකිරීමට වැඩිමනත් වශයෙනි. තවදුරටත්, අවශ්‍යනම් හමුදා බලඇනි සඳහා වැඩි අරමුදල් සපයන්නට මුඛර්ජි පොරොන්දු විය. ඉන්දියානු ධනේශ්වරය මිලියන සිය ගනනක ජනතාවක් දුක්ඛිතභාවයට ඇද දමන අතරේදී පවා, ලෝක බලයේ පාලක පන්තියක් වීමේ අභිලාෂය හඹායෑම සඳහා, දැවැන්ත හමුදාමය වැඩිදියුනුකිරීම්, බැලස්ටික් මිසයිල සංවර්ධනය, සහ ගැඹුරු මුහුදේ නාවික බලඇනි පුලුල් කිරීම දිගටම කරගෙනයමින් සිටී.

© www.wsws.org